192414

NATIONAL LIBRARY
N.L.S.L OF SRI LANKA
13/06/2023
14:46:08

1985-6-29

ශ්‍රී ලංකා SRI LANKA இலங்கை

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 19 දරන
# වැන්දඹු පුරුෂ සහ අනත්දරු
# විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 මැයි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 මැයි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

මිල: ශත 45 යි

තැපැල් ගාස්තුව: ශත 60 යි

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

NATIONAL LIBRARY N L S L OF SRI LANKA 13/06/2023 14:46:08

# 1985 අංක 19 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 මැයි මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 60/84

1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1985 අංක 19 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1983 අංක 24 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 3 වන වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

> "(6) සෑම නිලධාරිනියකම විසින් මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දින සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට තීරණය කළ යුතු ය. මේ වගන්තිය ක්‍රියාත්මක වීමට කලින් ඒ නිලධාරිනිය මියගොස් ඇති අවස්ථාවක හෝ දායිකාවක වීමට තීරණය කිරීමට ඇයට හැකිව තිබූ කාලසීමාව ඉකුත් වීමට පෙර ඒ නිලධාරිනිය මිය යන අවස්ථාවක, ඒ මරණයෙන් පසු ඇගේ ස්වාමිපුරුෂයා හෝ දරුවකු හෝ ස්වාමිපුරුෂයා සහ දරුවකු හෝ ස්වාමිපුරුෂයා සහ දරුවන් ජීවත්ව සිටින්නේ නම්, ඇය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට තීරණය කොට තිබූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

*දායිකාවක වී සිට ඉල්ලා අස්වන නිලධාරිනියකට දායක මුදල් ආපසු ගෙවීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද විශ්‍රාම වැටුප් ක්‍රමයට මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුව දායිකාවක් වීමට තීරණය කරනු ලැබුවා වූ ද, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියෙහි සඳහන් අඩු කිරීම් වැටුපෙන් අඩු කරනු ලැබුවා වූ ද, යම් නිලධාරිනියක විසින්, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත දායිකාවක වී සිටීමෙන් ඉල්ලා අස්විය හැකි ය. එවිට ඇගේ සම්පූර්ණ දායක මුදල් පොලී රහිතව ආපසු ලබා ගැනීමට ඇයට හිමිකම තිබිය යුතු ය. නමුත් ද, ඒ දායක මුදල් ආපසු ගෙවනු ලැබූ විට, ඒ දායිකාවට හෝ ඇය මඟින් හෝ ඇය යටතේ හිමිකම් පාන යම් තැනැත්තකුට ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ යම් ප්‍රතිලාභයක් ලැබීමට ඇති හිමිකම අවසන් වන්නේ ය.

ඒ— 083222—6,750 (85/04)